-------------------------------------------------------------------------------------------------------------------------------

**කරෙයිනගර් ප්‍රාදේශීය සභාව**

**යාපනය දිස්ත්‍රික්කය**

------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කරෙයිනගර් ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1:3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව්කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

ආදායම , වියදම , වත්කම් හා වගකීම් වලට අදාලව ගිණුම් වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු අවස්ථා ගණන හා වටිනාකම යටතේ පහත වගුවෙන් දැක්වේ.

| | ආදායම් | | වියදම | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | රු. | - රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (අ) ගිණුම්වල වැඩියෙන් දැක්වීම | - | - | 01 | 4,406,253 | - | - | 01 | 654,048 |
| (ආ) ගිණුම්වල අඩුවෙන් දැක්වීම | 01 | 700 | - | - | 01 | 407 | - | - |

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,630,336 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වටිනාකම රු.5,893,244 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1:3:5 අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධාන වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| 150(අ) වගන්තිය | රු.426,356 ක හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි. |

(ආ) 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන ) රීති

| රීති | |
|---|---|
| 81 රීතිය | සභා බල ප්‍රදේශයේ ඉඩම් ගනුදෙනු වලට අදාල මුද්දර ගාස්තු ආපසු අයකර ගැනීම සඳහා එක් එක් කාර්තුව අවසානයේදී රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉල්ලීම් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,697,266 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,426,089 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපතකර තිබූ ඇස්තමේන්තුගත ආදායම තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 1,450 | 1,247 | 228 | - | 60 | 228 |
| බදු කුලී | 387 | 345 | - | 365 | 267 | - |
| බලපත්‍ර ගාස්තු | 131 | 127 | - | 121 | 110 | - |
| වෙනත් ආදායම් | 11,866 | 9,287 | 557 | 10,043 | 7,977 | 1,685 |

### 2:2:2 උසාවි දඩ මුදල්

2010 දෙසැම්බර් 31 දක්වා විවිධ ආඥා පනත් යටතේ කරෙයිනගර් මහේස්ත්‍රාත් අධිකරණය විසින් රැස්කර ප්‍රධාන ලේකම්වරයාට ප්‍රේෂණය කරන ලද රු.349,950 ක් වූ උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 වර්ෂය සඳහා අයකර ගත යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 ආදායම් ණයගැතියෝ

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව 2010 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු එකතුව රු.785,000 ක් වූ බදු ආදායම හා වෙළඳ කුටි කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම සහ විචලනයන පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පුද්ගල පඩිනඩි | 8,725 | 4,937 | 3,788 | 6,887 | 4,879 | 2,008 |
| වෙනත් | 2,257 | 1,372 | 885 | 1,860 | 1,109 | 751 |
| උප එකතුව | 10,982 | 6,309 | 4,673 | 8,747 | 5,988 | 2,759 |
| මූලධන වියදම් | 15,620 | 6,525 | 9,095 | 14,781 | 4,892 | 9,889 |
| මුළු එකතුව | 26,602 | 12,834 | 13,768 | 23,528 | 10,880 | 12,648 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | - |
| ද්විතියික ශ්‍රේණිය | 09 | 10 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 16 | 09 |
| වෙනත් | - | 05 |
| | 26 | 29 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | වත්කම් | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (අ) | පරිගණක | 02 | 59,700 |
| (ආ) | ජල පොම්ප | 02 | 30,000 |
| (ඇ) | ජල බවුසරය සමඟ ට්‍රැක්ටරය | 01 | 170,000 |
| | | 05 | 259,700 |

### 2:5:2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.784,933 ක් වූ අතර වර්ෂයකට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂ රු.435,483 ක් විය.

**2.5.3 අයවිය යුතු සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂ එකතුව රු.1,522,539 ක් වූ අතර වර්ෂ 1 කට වැඩි කාලයක් අයවීම් හිඟ හිටි ශේෂය රු.37,400 ක් විය.

**2:5:4 අචල ජංගම වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් ඉක්මවා පැවතුණු අචල ජංගම වත්කම් වටිනාකම රු.396,829 ක් විය.

**2.5.5 සමීක්ෂණය නොකළ වත්කම්**

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණනය කරන ලද වත්කම් වල වටිනාකම රු.16,479,224 ක් විය.

**2:6 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගනදෙනු**

2009 ජනවාර් 28 දිනැති අංක පීටී/01/2009 දරන උතුරු පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව සමීක්ෂණ මණ්ඩල කමිටු සාමාජිකයන්ට රු.13,000 ක දීමනාවක් ගෙවා තිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

උතුරු පළාත් සභාව විසින් සභාවට ලබාදෙන ලද කසුරිනර් වෙරළෙහි වෙළඳ කුටි දෙක 2011 ජුනි දක්වා අදහස් කළ කාරණයන්ට යොදා ගෙන නොතිබුණි.

**2.8 කාර්ය සාධනය**

සභාව විසින් වාර්ෂික ක්‍රියාකාර් සැලැස්ම ගිණුම් වර්ෂය ආරම්භයේ පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉටුකර ගත යුතු අරමුණු හා ඒ පිළිබඳ ප්‍රගතිය තහවුරු කර ගත නොහැකි විය.

**2.9 අභ්‍යන්තර විගණනය**

ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

අ. අයවැය පාලනය

ආ. ගිණුම්කරණය

ඇ. ආදායම් පර්පාලනය

ඈ. මානව සම්පත්

ඉ. වත්කම් කළමනාකරණය

ඊ. මෝටර් වාහන උපයෝජනය